www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019
# ඉස්ලාම් ධර්මය

**6 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

**නම/ විභාග අංකය:**

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ''රිසාලත්'' යන අරාබි පදයේ අර්ථය වන්නේ,
(i) ධර්මදූත මෙහෙවර (ii) නබිත්වය
(iii) විශ්වාසය (iv) පාරිශුද්ධභාවය

02 ''තව්හීද්'' යන පදයේ විරුද්ධ පදය වන්නේ,
(i) නිෆාක් (ii) ෂිර්ක් (iii) කුෆ්ර් (iv) හරාම්

03 ''ආමන්තු බිල්ලාහ්'' යන්නෙහි අර්ථය
(i) අල්ලාහ් තආලා විශ්වාස කිරීම. (ii) මලක්වරු විශ්වාස කිරීම.
(iii) ආගමික කෘති විශ්වාස කිරීම. (iv) රසූල්වරුන් විශ්වාස කිරීම.

04 ආදම් (අලෛ) තුමා මවන ලද්දේ
(i) ශබ්දයෙන් (ii) ගින්නෙන් (iii) මැටිවලින් (iv) සුළඟින්

05 ''නාමූසුල් අෑලම්'' යන විශේෂ නමින් හඳුන්වන්නේ කවුරුන් ද?
(i) ඉස්රාෆීල් (අලෛ) (ii) මාලික් (අලෛ)
(iii) රිල්වාන් (අලෛ) (iv) ජිබ්රීල් (අලෛ)

06 ඉස්ලාම්හි දෙවන අනිවාර්ය්‍ය කරුණ වන්නේ,
(i) සලාත් (ii) සකාත් (iii) සව්මය (iv) හජ්

07 ''ලයිලතුල් කද්ර්'' රාත්‍රිය එළඹෙන මාසය වන්නේ,
(i) මුහර්රම් (ii) රජබ් (iii) රමධාන් (iv) දුල්හජ්

08 වුළුහි අනිවාර්යය කරුණු වලින් එකක් වන්නේ,
(i) කිබ්ලාව දෙසට මුහුණ යොමුකිරීම. (ii) හිස මස්හු කිරීම.
(iii) කං මස්හු කිරීම. (iv) දත් මැදීම

09 වස්තූන් පිරිසිදු කරන්නාවූ ඉස්ලාමික වගකීම හඳුන්වන්නේ,
(i) කලිමා (ii) සලාතය (iii) සකාත් (iv) සව්මය

10 ''පිරිසිදුකම ඊමානයේ අඩකි'' යනු
(i) අල්කුර්ආනයේ වැකියකි. (ii) නබි (සල්) තුමාගේ වැකියකි.
(iii) සහාබිවරුන්ගේ වදනකි. (iv) ඉමාම්වරුන්ගේ වදනකි.

- **සුදුසු වචනය තෝරා හිස්තැන් පුරවන්න.**
**(අල්ලාහ් / සහජීවනය / සලාම් / සලාතය / මිඃරාජ්)**

11 ඊමාන් කරන්නකු හා ඊමාන් නොකරන්නකු අතර වෙනස .......................................... බව ගෙනහැර දක්වේ.
12 සෑම දේකම මැවුම් කාරයාණන් වන්නේ .......................................................................
13 ඉවසීම, ........................................................................ යනාදීන් ඉස්ලාම් ධර්මයේ ගුණාංගයන් වේ.
14 යම් සභාවකට පැමිණෙන විට .................................................... පැවසිය යුතුය.
15 නබි (සල්) තුමාණන් අහස් හතක් ඉක්මවා ගිය ගමන හඳුන්වන්නේ ............................................ යනුවෙනි.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

- **පහත සඳහන් කරුණු නිවැරදි නම් (✓) යනුවෙන් ද, වැරදි නම් (×) යනුවෙන් ද සටහන් කරන්න.**

16 ශුද්ධවූ අල්කුර්ආනය වසර 23 ක් කොටස් වශයෙන් පහළ විය. ( )

17 ඉස්ලාමික මගපෙන්වීම් අනුගමනය නොකරන්නන් ස්වර්ගය පිවිසෙති. ( )

18 මක්කමේ සිට මදීනාවට ගමන් කළ සහාබාවරුන්ට අන්සාරිවරුන් උපකාර කළහ. ( )

19 අන් අයගේ නිවෙස්තුළට ජනේලය මාර්ගයෙන් බැලිය හැකිය. ( )

20 ලෝකයේ උසස්ම මිනිසා මුදල් හිමි අය වේ. ( )

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) ස්වර්ගයේ යතුර යනුවෙන් හඳුන්වන නැමදුම කුමක් ද?

(ii) මුෂ්රික්වරුන් යනු කවුරුන් ද?

(iii) අනිවාර්ය ෆර්ල් සව්මය යෙදෙන්නේ කුමන මාසයේ ද?

(iv) මෘදු නජීසයට උදාහරණයක් සඳහන් කරන්න.

(v) දිවෙන් ඉටුවන පාප ක්‍රියාවන් දෙකක් නම් කරන්න.

(vi) නබි (සල්) තුමාණන්හට පහළ වූ පළමු අල්කුර්ආන සුරාව කුමක් ද?

(vii) අවසන් දිනයේ ''කුර්රත් මුහජ්ජලීන්'' යනුවෙන් සඳහන් වන අය කවුරුන් ද?

(viii) ලොවට පහළ වූ අවසන් ආගම් ග්‍රන්ථය කුමක් ද?

(ix) ආබ්රහාගේ ඇත් රංචුව විනාශ කළ කුරුළු රංචුවේ නම කුමක් ද?

(x) ''සුරතුල් අහද්'' ''සුරතුල් තව්හීද්'' යනුවෙන් හැඳින්වෙන සුරාව කුමක් ද? (ලකුණු 2 x 10 = 20)

02 (i) ''ඊමාන්'' යනු කුමක් ද?

(ii) අල්ලාහ්ගේ මැවීම් හතරක් නම් කරන්න.

(iii) අප විශ්වාස කළයුතු කරුණු සඳහන් කරන්න. (ලකුණු 2 + 4 + 4 = 10)

03 (i) ''තව්හීද්'' යනු කුමක් ද?

(ii) ඉස්ලාම්හි කුළුණු පහ සඳහන් කරන්න.

(iii) දෙවන සූර්වලින් පසුව සිදුවන ක්‍රියාවන් කුමක්දැයි සඳහන් කරන්න. (ලකුණු 2 + 4 + 4 = 10)

04 (i) ආදම් (අලෛ) තුමාගේ ඉළඇටයින් බිහිකරන ලද්දේ කවුරුන් ද?

(ii) මිනිසා හා මලාඉකාවරුන් අතර තිබෙන වෙනස්කම් හතරක් සඳහන් කරන්න.

(iii) අන්‍ය නිවසකට ඇතුල් වන විට පිළිපැදිය යුතු ක්‍රමයන් සඳහන් කරන්න. (ලකුණු 2 + 4 + 4 = 10)

05 (i) ''ඉස්ලාම්'' යනු අරාබි වචනයේ අර්ථය කුමක් ද?

(ii) දෙමව්පියන්ට කළයුතු උපහාර හතරක් සඳහන් කරන්න.

(iii) අල්කුර්ආනය පාරායනය කරනවිට පිළිපැදිය යුතු ක්‍රමයන් සඳහන් කරන්න. (ලකුණු 2 + 4 + 4 = 10)

06 (i) ශුද්ධවූ මක්කමේ පමණක් ඉටුකළයුතු ඉස්ලාමික වගකීම කුමක් ද?

(ii) සලාතයේ වැදගත්කම සඳහන් හදීසයක් ලියන්න.

(iii) උපවාසයෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ලකුණු 2 + 4 + 4 = 10)

07 (i) ''අත්තහාරත්'' යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(ii) ඉතා පිරිසිදු ජලය (අල් මාඋන් තහුර්) භාවිතා කරමින් ඉටුකරන ආගමික වගකීම් දෙකක් සඳහන් කරන්න.

(iii) නජීස්හි වර්ග සඳහන් කරන්න. (ලකුණු 2 + 4 + 4 = 10)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk